# ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කොට රටතුල නීතියේ ආදිපත්‍යය ඇති කරනු- රටවැසියාගේ අයිතිවාසිකම් රකිනු

රටේ සාමාන්‍ය නීතිය පිළිබඳ මතකය දැන් මහජනතාව තුල අමතකව ගොස් ඇත. කවුරුත් දන්නා එකම 'නීතිය', ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ, රජයේ සංස්ථාවලට විශාල බලතල පවරමින් ඇති කර ඇති රෙගුලාසින්ය. රටේ සාමාන්‍ය නීති ක්‍රමය තුල පැවති නිදහස හා ආරක්ෂාව දැන් බොහෝ දෙනෙකුට හිතාගැනීමටත් බැරි දෙයක් බවට පත්වී ඇත.

කෙසේ වුවත් රටේ ත්‍රස්තවාදය වැළැක්වීම සඳහා ඇති කරන ලද අතිශයින් මර්දනකාරී නීතිමය රටාව පවත්වාගෙන යෑමට දැන් කිසිම හේතුවක් නැත. දැනට මාස හතරකට පෙර එල් ටී ටී ඊ සංවිධානය විසින් මෙහෙයවුනු ත්‍රස්තවාදී ව්‍යාපාර මුළුමනින්ම අවසන්කොට දැමූ බව රජය විසින්ම ප්‍රකාශයට පත්කොට ඇත. රජය විසින් පුණ පුණා කියනු ලබන්නේ අවුරුදු 30 ක පමණ කාලයක් තුල කාටවත් පරාජය කල නොහැකි වූ ත්‍රස්තවාදය, මේ රජය විසින් මුළුමනින්ම නැතිකර දමන ලද බවය. මේ අනුව ලංකාව තුල ත්‍රස්තවාදය වළක්වාලීමේ පනත පවත්වාගෙන යෑමට කිසිදු හේතුවක් දැන් පවතින්නේ නැත.

එය තවදුරටත් ක්‍රියාත්මක කරවාගෙන යෑම සඳහා හේතුව ලෙස දක්වන්නේ ත්‍රස්තවාදය නැවත ඇතිවීම වළක්වාගැනීම සඳහා මෙම පනත අවශ්‍ය බවය. මෙය විකාර කථාවකි. ලෙඩකින් සුවපත්වූවෙකු, අනාගතයේදී ද එම රෝගය ඇතිවීම වළක්වාගැනීම සඳහා, ඔහු රෝගය පැවති කාලයේ පාවිච්චිකල ඖෂධ සාදාකාලිකව පාවිච්චිකල යුතුද? එසේ කලහොත් ඔහුගේ සෞඛ්‍යයට වන හානිය කොපමණද? ලෝකය තුල වරක් විසඳුනු ප්‍රශ්නයක් නැවත ඇතිවීමට ඉඩකඩ ඇත. උදාහරණයක් වශයෙන් 1945 දී දෙවන ලෝක මහා සංග්‍රාමය අවසන් විය. එසේ වුවත් තුන්වන ලෝක සංග්‍රාමයක් ඇති වීමට ඇති ඉඩකඩ නැතිවූයේ නැත. එහෙත් දෙවන ලෝක සංග්‍රාමය පැවති යුගයේ පැවති තත්ත්තවය සදාකාලිකව පවත්වාගෙන යෑම, තුන්වන ලෝක සංග්‍රාමයක් වළක්වාගැනීමට ඇති එකම ක්‍රමයකැයි කවුරුන් හෝ තර්ක කලහොත් එය විහිළුවක් හෝ විකාරයක් ලෙස සලකනවාට සැකයක් නැත. ත්‍රස්තවාදය වළක්වාගැනීමේ පනත තවදුරටත් පවත්වාගත යුතුය, යන මතයද එවැනිම විහිළුවක් හා විකාර කථාවකි.

ත්‍රස්තවාදය වළක්වාලීමේ පනත තවදුරට පවත්වාගෙන යෑම හුදෙක්ම දැනට පාලනය කරන පාලක පක්ෂයේ අවශ්‍යතාවයන් උඩ සකල ජනතාව මර්දනය කිරිමේ අරමුණින්ම පමණක් තවදුරටත් පවත්වාගෙන යන බවට කෙරෙන චෝදනාව සාධාරණය. එම චෝදනාවට පිළිගත හැකි බුද්ධිගෝචර

පිළිතුරක් දිය නොහැකිය. බුද්ධිගෝචරව කල හැකි එකම දෙය නම් එම පනත අහෝසි කොට රටතුල ස්වාභාවික සම්බන්ධකම් පවත්වාගෙන යා හැකි රටේ සාමාන්‍ය නිතිය නැවත පණ ගැන්වීමය.

බොහෝ කාලයක්, ත්‍රස්තවාදී විරෝධී නිතිය මගින් රටේ සාමාන්‍ය නිතිය යටපත් කර දමා තිබීම නිසා එම සාමාන්‍ය නිතිය පිළිබඳව මතකය පවා අමතකව ගොස් ඇත. එම සමාන්‍ය නිතිය යටපත් වීම මගින් රටේ සියළුම සංස්ථා ඉතා ප්‍රබල ආකාරයකින් විනාශයට පත්ව ඇත. රටේ අධිකරණයේ නිදහස ත්‍රස්තවාදී නිතිය මගින් මහා පරිමාණව යටපත් කොට ඇත. රටේ අධිකරණයට සියළුම ප්‍රශ්නවලට මැදිහත්වීමට ඇති අයිතිය ත්‍රස්තවාදී පනත මගින් මහා පරිමාණව සීමා කොට ඇත. විධායකයට කැමති ආකාරයෙන් පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම, දීර්ඝ කාලයක් රඳවාගැනීම, සමාජයෙන් විවිධ පුද්ගලයන් මුළුමනින්ම හුදකලා කිරිම මගින් ඔවුන්ට පවුල් සමග හා බාහිර සමාජය සමග පවත්වන සම්බන්ධකම් එසේ පවත්වාගැනිමට ඉඩ නොදීමද සිදුවිය. සාමාන්‍ය කාලයක් තුල ලබාගත හැකි නිතිඥ සහයෝගයද ඔවුන්ට අහිමිකර ඇත. මෙම නිසා ලංකාවේ ස්වාභාවික සමාජය මුළුමනින්ම විකෘර්ති තත්ත්වයකට පත්ව ඇත.

ත්‍රස්තවාදී පනත වලංගුව ක්‍රියාත්මක වන තාක් දුරට, අපරාධ පරීක්ෂණ අංශය හා ත්‍රස්තවාදී විමර්ශන කොට්ටාශය අතිමහත් බලයෙන් යුතු සංස්ථාවල් බවට පත්වන අතර ඒවා නිතියේ සාමාන්‍ය පාලනයෙන් පිට පවතින සංස්ථා බවට පත්වේ. ඒවායේ බලය පාලනය කිරිමට අභ්‍යන්තර, සංවරන හා තුලන (check and balances) පවතින්නේ නැත. සැකකරුවන්ට විරුද්ධව වදහිංසා කරන බවත් මනඃකල්පිත චෝදනා දමන බවත් අත්අඩංගුවේදී මරණ පවා සිදුවන බව පිළිබඳව ඇති චෝදනා ගැන සාමාන්‍ය නිතිය තුලින් කෙරෙන අධීක්ෂණයට හා පරීක්ෂණයට ඉඩකඩ ද පවතින්නේ නැත. සිදුවන අසාධාණකම් පිළිබඳව පැමිණිලි විශාල වුවත් ඒවා ගැන කිසිදු සාධාරණ පියවරක් ගැනීමට කිසිවෙකුටත් බැරිය.

ඉතා සරලව කිවහොත් ත්‍රස්තවාදී වැළැක්වීමේ පනත තුලින් දසදහස් සංඛ්‍යාත ජනතාවකට නිතියෙන් සහනයක් ලබාගැනීම වළක්වනු ලබයි: ඔවුන් සියල්ලන්ටම නිතියේ ආරක්ෂාව අවලංගු කොට දමනු ලබයි, මෙය සමස්ථ ජනතාව කෙරෙහිම බලපානු ලබයි. ලංකාවේ සියළුම ජනතාව විසින් මෙන්ම, ලංකාවෙන් පිට ජීවත්වන ශ්‍රී ලාංකියන් හා ජාත්‍යන්තර ප්‍රජාව මගින් වහාම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කරන ලෙස ලංකාවේ ආණ්ඩුවෙන් ඉල්ලා සිටිමට කාලය පැමින ඇත. අධිකරණයේ බලය මෙම ත්‍රස්තවාදි පනතේ ඇති මහා පරිමාණ සීමා කිරිම් වලට යටත් නොකල යුතුය. නිතියේ ආදිපත්‍යය නැවත ඇතිකල යුතුය. සකල ජනතාවටහ නිතියේ ආරක්ෂාව ලබාදිය යුතුය.

මෙය වඩාත් ප්‍රබලව බලපාන්නේ රටේ තරුණ තරුණියන් කෙරෙහිය. ඔවුහු දන්නා එකම 'නීතිය' මෙම ත්‍රස්තවාදය වැළැක්වීම පිළිබඳ නීතියය. රටක් තුළ ස්වභාවිකව පැවතිය යුතු නීතිය පිළිබඳව හා ආරක්ෂාව පිළිබඳව කිසිදු වැටහීමක් ඔවුන්ට ඇත්තේ නැත. මර්දනකාරී හස්තයේ මහා බලය ගැන පමණක් ඔවුහු දනිති. රටේ ප්‍රජාචාරය වශයෙන් ඔවුන් දැක ඇත්තේ හා අත් දකින්නේ මර්ධනය හා දරදඬු නීතීන්ය. මෙසේ අනාගත පරම්පරාවේ මානසික තත්ත්වයත්, සමාජ විඥානයත්, අනාගතය පිළිබඳ ඇති බලාපොරොත්තුත් යටපත්කර දමා ඇත. මෙය රටේ තරුණ තරුණියන් හා අනාගත පරම්පරාව කෙරෙහි කෙරී, ඇති මහාපරිමාණ අපරාධයකි. මෙය නතර කිරීමේ කාලය පැමිණ ඇත.

**ආසියානු මානව හිමිකම් කොමිසම**